# මැකායි ප්‍රාදේශීය සභා වෙබ් අඩවි පරිවර්තනය
# (Mackay Regional Council Website Translation)

මැකායි ප්‍රදේශය තුල යටිතල පහසුකම් සහ සේවා සැපයීම සම්බන්ධයෙන් වගකීම දරණු ලබන පළාත් පාලන ආයතනය මැකායි ප්‍රාදේශීය සභාවයි.

**ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය මට්ටම්**
ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය මට්ටම් තුනක් ඇත. එක් එක් මට්ටම් මගින් විවිධ සේවා සපයන අතර විවිධ වගකීම් දරයි.

**ෆෙඩරල් රජය**
ඕස්ට්‍රේලියාවේ ජාතික රජය ෆෙඩරල් රජය වේ. එමගින් පර්ලිමේන්තුවේ නිර්මාණය කරන නීතින් ක්‍රියාවට නැංවීම සිදු කරන අතර වෙළඳ සහ කර්මාන්ත, නිරෝධායනය, භාවිතා කරන මුදල්, පේටන්ට් බලපත්‍ර, විවාහ, සංක්‍රමණ, ආරක්ෂාව, විදුලි සංදේශ, සමාජීය උපකාර සැපයීම සහ මෙඩිකෙයාර්, සෙන්ටර්ලින්ක් වැනි අනෙකුත් සුභ සාධන ගෙවීම් සහ රැකියා ජාලය පිළිබඳ වගකීම දරයි.

**ප්‍රාන්ත රජය / සන්තක ප්‍රදේශ**
ප්‍රාන්ත (කුවීන්ස්ලන්ඩ්, නිව් සවුත් වේල්ස්, වික්ටෝරියා, සවුත් ඕස්ට්‍රේලියා, වෙස්ටර්න් ඕස්ට්‍රේලියා සහ තස්මේනියා) සහ සන්තක ප්‍රදේශ (නොදර්න් ටෙරිටරි සහ ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි) මගින් පොලීසිය, රජයේ පාසල්, මාර්ග සහ ප්‍රවාහන, රජයේ රෝහල්, රජයේ නිවාස සහ ව්‍යාපාරික නීති රීතීන් පිළිබඳ වගකීම දරයි.

**පළාත් රජය**
පළාත් පාලන ආයතන මගින් ඔබ ජීවත්වන පරිසරය පිළිබඳව සොයා බලන අතර ප්‍රාදේශීය ප්‍රජාවෙහි සිටින සියළුම අය හට ඉතා වැදගත් වන බොහෝ සේවා සපයනු ලැබේ. පළාත් පාලන ආයතන වෙත විශාල වශයෙන් මුදල් එක් රැස් වෙනු ලැබෙන්නේ පළාතේ දේපළ හිමියන් විසින් ගෙවනු ලබන බදු මගිනි.

**මැකායි ප්‍රාදේශීය සභාවට අයත් වන්නාවූ පළාත් පාලන ප්‍රදේශය**
උතුරින් ඕ'කොනල් නදියෙනුත් (O'Connell River), බටහිරින් බ්‍රොකන් නදිය ව්‍යාප්ත ප්‍රදේශයෙන් (Broken River Range) සහ දකුණින් පාමර්ස්ටන් තුඩුවෙන්ද (Cape Palmerston) මායිම්වී පළාත් පාලන ප්‍රදේශය පවතී.

දිවයින් 70ක් සහ ග්‍රේට් බැරියර් ගල්පර (Great Barrier Reef) වලින් විශාල කොටසක් සහිතවූ වර්ග කිලෝ මීටර 7,621 ක භූමි ප්‍රමාණයක් මැකායි ප්‍රාදේශයට අයත් වේ. බ්‍රිස්බේන් වලට කිලෝමීටර 803 ක් උතුරින් මැකායි හි මහ නගරය පිහිටුවා ඇති අතර 100,000කට අධික ජනගහණයක් සහිත ප්‍රාදේශයේ ඇති විශාලම මහ නගරය මෙය වේ.

**නගරාධිපති සහ මන්ත්‍රණ සභා සාමාජිකයන්**
ප්‍රජාව තුළ සිටින සුදුසුකම්ලත් නිත්‍ය වැසියන් සහ බදු ගෙවන්නන් විසින් නගරාධිපති සහ මන්ත්‍රණ සභා සාමාජිකයන් තෝරා පත් කර ගනු ලැබේ. ප්‍රජාවෙහි නායකයා ලෙස නගරාධිපතිවරයාව සලකනු ලැබේ. ප්‍රාදේශයට අවශ්‍ය සේවා සහ පහසුකම් තීරණය කිරීම මන්ත්‍රණ සභා සාමාජිකයන්ගේ කාර්‍යභාරය වේ. ඔවුන්ගේ තීරණ ගැනීමට සහ ප්‍රාදේශීය ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට විධිමත් රැස්වීම් ඔවුන් විසින් පවත්වනු ලැබේ.

**සේවාවන්**
මැකායි ප්‍රාදේශීය සභාව විසින් විවිධ සේවා සපයනු ලැබේ:
- අනුමැති සැළසුම් කිරීම
- ප්‍රාදේශීය මංමාවත් නඩත්තු කිරීම සහ නව පාලම් සහ මාර්ග ඉදි කිරීම
- රථගාල් සැපයීම සහ නඩත්තු කිරීම
- ප්‍රජා ශාලා සහ අනෙකුත් පොදු ගොඩනැගිලි නඩත්තු කිරීම

- ඉඩකඩම් භාවිතය විධිමත්ව හැසිරවීම
- සෞඛ්‍යය සහ නියාමක සේවා ( ආහාර බලපත්‍ර, සතුන් ලියාපදිංචි කිරීම)
- කෘමීන් සහ වල් පැළෑටි පාලනය කිරීම
- පොදු පිට්ටනි සහ උද්‍යාන නඩත්තු කිරීම
- ප්‍රජා සේවා සහ ක්‍රියාකාරකම්
- ජලය සහ ජල ප්‍රවාහන පද්ධතිවලට ප්‍රතිකාර කිරීම
- ජල පිටාර ගැලීම් පාලනය
- නිවාස වලින් බැහැර කරන අපද්‍රව්‍ය එකතු කිරීම සහ එකතුකර ගත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම
- කලා සහ සංස්කෘතික සංවර්ධනය

**පහසුකම්**

ප්‍රාදේශීය සභාව මගින් විවිධ පහසුකම් ක්‍රියාත්මක කරන අතර ඒ අතර පහත දේවල්ද ඇතුළත් වේ:

| | |
|---|---|
| Administration Building<br>Civic Centre, Gordon Street, Mackay | 1300 622 529 |
| Mirani Customer Service Centre<br>20 Victoria Street, Mirani | 1300 622 529 |
| Sarina Customer Service Centre<br>65 Broad Street, Sarina | 1300 622 529 |
| Artspace Mackay<br>Civic Centre, Gordon Street, Mackay | 07 4961 9775 |
| පුස්තකාල සේවා<br>(පහත ඇති සවිස්තරාත්මක තොරතුරු බලන්න) | |
| Blue Water Lagoon<br>Caneland Park, River Street, Mackay | 1300 622 529 |
| Pioneer Swim Centre<br>Malcomson Street, North Mackay | 07 4957 5767 |
| Memorial Swim Centre<br>Milton Street, Mackay | 07 4961 9533 |
| Mirani Pool<br>3 Caroline Street | 07 4959 1239 |
| Mackay Regional Botanic Gardens<br>Lagoon Street, West Mackay | 07 4952 7300 |
| Mackay Entertainment & Convention Centre<br>Civic Centre, Gordon Street, Mackay<br>(Alfred Street අග) | 07 4961 9777 |

**ප්‍රජා ශාලාවන්**

ප්‍රාදේශීය ප්‍රජා ශාලාවන් ක්‍රීඩා සහ අත්කම් පංති, රැස්වීම් සහ උත්සව වැනි විවිධ අවශ්‍යතා සඳහා යොදා ගත හැක. මැකායි ප්‍රාදේශීය සභාව පුරා කුලියට දීම සඳහා ප්‍රජා ශාලා සහ වෙනත් ඉඩ පහසුකම් ඇති අතර මේ සඳහා විවිධ ගාස්තුන් අය කෙරේ.

**පොදු ප්‍රවාහනය**

මැකායි බස්රථ මගින් මැකායි, මිරානි සහ සරිනා ඇතුළු ප්‍රාදේශික ප්‍රදේශ වෙත ප්‍රවාහන සේවා සපයයි. www.mackaytransit.com.au යන ඔවුන්ගේ වෙබ් අඩවිය ඔස්සේ බස්රථ ධාවනය වන කාලසටහන් ලබා ගත හැක. එසේම ඔබගේ ප්‍රාදේශීය සභා කාර්යාලය හෝ පුස්තකාලය මගින්ද මෙම කාල සටහන් ලබා ගත හැක.

**පුස්තකාල සේවා**
පුස්තකාල මගින් සියළුම වයස් සහ අවශ්‍යතාවයන් ඇති අය හට බොහෝ සේවා, සම්පත් සහ ක්‍රියාකාරකම් සපයනු ලැබේ. ප්‍රාදේශීය සභා පුස්තකාල මගින් අන්තර්ජාල සහ පරිගණක සේවා (word processing ඇතුලත්ව), දෘශ්‍යාබාධිත අය සඳහා ජායා පිටපත් උපකරණ සහ වෙනත් තාක්‍ෂණික උපකරණ ලබාදේ. විවිධ භාෂා ගණනාවකින් ඇති සී.ඩී. තැටි, ඩී.වී.ඩී. තැටි සහ පොත් එකතුවක් මෙයට ඇතුලත් වේ.

පුස්තකාල පිහිටි ස්ථාන සහ ඒ හා සම්බන්ධ විය හැකි තොරතුරු පහත සඳහන් වේ:

| | |
|---|---|
| Gordon White Library<br>Phillip Street, Mt Pleasant | 07 49619300 |
| Mackay City Library<br>Civic Centre, Gordon Street Mackay | 07 4961 9387 |
| Mirani Library<br>16 Victoria Street, Mirani | 07 4961 9231 |
| Sarina Library<br>65 Broad Street, Sarina | 07 4961 9297 |
| Walkerston Library<br>Dutton Street, Walkerston | 07 4959 2545 |
| Mobile Library | 0408 775 936 |

**ප්‍රජා සේවා**
ප්‍රාදේශිය සභාව ප්‍රජාවෙහි සිටින විවිධ ආකාරයේ අය සමඟ වැඩ කරයි. ඕනෑම ප්‍රශ්නයක් ඇති අය හෝ ප්‍රජා කණ්ඩායම් හට උපකාර කිරීමට කාර්‍ය්‍ය මණ්ඩලයට හැකිය. ඔබගේ වුවමනා සහ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් මෙන්ම, තොරතුරු හා සම්පත් හුවමාරු කිරීම සම්බන්ධයෙන්ද ඔබ වෙනුවෙන් කාර්‍ය්‍ය මණ්ඩලයට උපකාර කළ හැකිය.

එසේම මෙම සභා මගින් විශේෂිතවූ ව්‍යාපෘති සඳහා ලබා දෙන්නාවූ ප්‍රජා අරමුදල් පරිපාලනය කිරීම සහ ආධාර විමසීම් සහ ඉල්ලුම්පත් සඳහා උපකාර කිරීමද සිදු කෙරේ.

ප්‍රාදේශීය සභාවෙහි සිටින ප්‍රාදේශීය බහු සංස්කෘතික නිලධාරීන්, (Local Area Multicultural Partnerships (LAMP) Officers)) විශේෂයෙන් විවිධ භාෂා සහ සංස්කෘතික පසුබිම් සහිත අය සමඟ වැඩ කරයි. එසේම මැකායි ප්‍රාදේශීය සභාව තුළ සිටින නිත්‍ය වාසීන්ව වෙනත් නියෝජිත කාර්‍යාල සමඟ සම්බන්ධ කර මැකායි ප්‍රදේශය තුළ ස්ථාපනය වීමට ඔවුන්ට උපකාර කරති.

**ප්‍රජා නාමාවලිය**
නව පදිංචිකරුවන්ට උපකාරී වන්නාවූ, මැකායි ප්‍රාදේශීය සභාව තුළ පවතින සමාජ ශාලා, සංගම් සහ සංවිධාන ඇතුළත් කර ප්‍රජා නාමාවලියක් (Community Directory) ප්‍රාදේශීය සභාව මගින් සකස්කොට ඇත. එසේම ඉංග්‍රීසි ඉගෙනීමට උපකාරී වන්නාවූ ප්‍රාදේශීය සැපයුම් කරුවන්ද මෙම නාමාවලියට ඇතුළත් වේ.

**පරිවර්තන සහ තෝල්ක සේවා**
ප්‍රාදේශීය සභාව මගින් පරිවර්තන සහ තෝල්ක සේවාද (Translation and Interpreting Service (TIS)) උපයෝගී කර ගනී. ඔබ ප්‍රාදේශීය සභාවට පැමිණි විටදී ඔබට අවශ්‍ය නම් දුරකථනය හරහා පරිවර්තකයකු හා සම්බන්ධ කිරීමට පාරිභෝගික සේවා නිළධාරීන්ට හැකිය.

**සහභාගිත්වය**
අවශ්‍යතා මොනවාදැයි තීරණය කිරීම සඳහා, ප්‍රාදේශීය සභාව ප්‍රජාව සමග එකතු වී ක්‍රියා කළ යුතුය. ප්‍රාදේශීය සභා රැස්වීම් වලට සහභාගි වීමෙන්, පොදු වාර්තා බැලීමෙන්, ඔබගේ ප්‍රාදේශීය මන්ත්‍රණ සභා සාමාජිකයන් සමග සාකච්ඡා කිරීමෙන් සහ ඔබගේ අදහස් ප්‍රාදේශීය සභා වෙබ් අඩවිය වෙත යොමු කිරීම මගින් ඔබටද මේ සඳහා සහභාගි විය හැක.

**ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක වන වේලාවන්**
සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 8.30 සිට සවස 4.30 වන තුරු.

**සම්බන්ධවීමේ තොරතුරු**
Mackay Regional Council
PO Box 41
Gordon Street
Mackay QLD 4740

දුරකථන අංකය: 1300 622 529
ඊ-මේල්: council@mackay.qld.gov.au